# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } එස්පීපී/ආර්පී/ඩී/යූසීබී/05/19/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 ජූලි 23 දින.

සභාපති,

බලංගොඩ නගර සභාව.

බලංගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ඉඩම් 20 කට අදාලව වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් වර්ග 45 කට අයත් ස්ථාවර වත්කම් අයිතම 68 ක වටිනාකම වූ රු. 735,086 ක් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) දේශීය ණය සංවර්ධන අරමුදලෙන් බස් නැවතුම්පල සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගෙන තිබුණු රු. 111,209,828 ක ණය මුදල සම්බන්ධයෙන් වාරික මුදල් නිසි පරිදි නොගෙවීම නිසා ණය හා පොළී වශයෙන් රු. 91,209,828 ක් එම අරමුදලට ගෙවිය යුතුව තිබුණි. එම ණය මුදල හා පොළිය නැවත සංශෝධනය කර කපා හරින ලද රු. 54,128,411 ක ගෙවිය යුතු පොළිය වැරදීමකින් ණය ගිණුමට ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂ 19 කට අදාලව එකතුව රු. 132,058 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාල රු. 255,323 ක පුනරාවර්තන වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් රු. 1,152,218 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් රු. 130,899 ක් වූ වායු සමීකරණ යන්ත්‍රයේ වටිනාකම ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත වී නොතිබුණි.

(ඌ) 2020 ජනවාරි ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද රු. 7,000,000 ක් සමාලෝචිත වර්ෂයේ ආයෝජනයක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ මිළදී ගත් එකතුව රු. 1,415,086 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ ලීබඩු හා සවිකිරීම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) වසර 10 කට පෙර සිට වෙනස් වෙමින් ඉදිරියට එන රු. 596,080 ක් සහ සමාලෝචිත වර්ෂය තුළ ඇති වූ රු. 86,270 ක් ද වශයෙන් එකතු වටිනාකම රු. 682,350 ක් වූ අගරු වෙක්පත් ශේෂය හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ණයහිමි කේවල ශේෂ ලේඛණය අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩා ණයහිමි ශේෂය රු. 892,915 ක් වුවත් එය ණය හිමි පාලන ගිණුමේ රු. 1,197,960 ක් වූයෙන් රු. 305,045 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 19,019 ක් වූ පුස්තකාල පොත් 94 ක් ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නගර සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

මාගේ මතය වන්නේ,

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයේදී මා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ඇතුළත් බව.

### 1.6 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 154 (1) සහ 157 (6) (උ) වගන්ති | - | බලංගොඩ නගර සීමාවේ ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය කිරීම හා දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සඳහා 2018 වර්ෂයේ දී පිළියෙල කර තිබූ අතුරු ව්‍යවස්ථාව අනුමත කර ගැනීමට 2019 දෙසැම්බර් 31 වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 (1) (අ) සහ 104 (4) වගන්ති | 13, 000 | 2018 වර්ෂයේ දී සිදුව තිබූ කැබ් රථ අනතුරට වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 1,604,413 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,743,028 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,745,000 | 8,149,957 | 7,356,497 | 3,021,434 | 8,590,000 | 8,991,122 | 7,993,892 | 4,012,406 |
| (ii) | කුලී | 31,225,000 | 31,332,843 | 30,942,713 | 1,032,891 | 24,360,000 | 28,088,669 | 28,144,527 | 804,356 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,710,000 | 4,406,843 | 4,378,290 | - | 4,000,000 | 3,804,125 | 3,804,125 | - |
| (iv) | වෙනත් ආදායම් | 42,950,000 | 30,774,124 | 64,446,547 | 12,979,122 | 28,310,000 | 24,356,748 | 23,745,450 | 160,164 |

### 2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වෙනත් ආදායම් විෂයයේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 85 කින් වැඩි වී තිබූ අතර, බලපත්‍ර ගාස්තු ,ආදායම් ආධාර, වරිපනම් හා බදු සහ වරෙන්තු ගාස්තු හා දඩ යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 07 කින්, 09 කින්, 16 කින් සහ 36 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් ගාස්තු රු. 2,277,995 ක් අයකර ගැනීමට 2019 දෙසැම්බර් 31 වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර හිඟ වරිපනම් ගාස්තු සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක්ද සකස් කර නොතිබුණි.

### 2.2.4 කුලී

ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ කුලී හා ගාස්තු රු. 354,444 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2014 ජනවාරි සිට 2019 ජුනි දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 20,609,670 ක් සහ 2019 ජුලි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් අයකර ගැනීමට 2020 මාර්තු වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

නගර සභා අඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 101 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් ඉන් කාරණා 70 ක් සඳහා 2019 දෙසැම්බර් වනවිටත් අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය වසරකට ටොන් 504 බැගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ එක්රැස් වන අතර නාය ගිය කසල කන්ද අසල වූ විවෘත භූමියක ගොඩගසා තිබුණු මෙට්‍රික් ටොන් 1057 ක පමණ වූ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ඝන අපද්‍රව්‍ය තොගය පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් 2019 දෙසැම්බර් 31 වනවිටත් සකස් කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ එකතුව රු. 12,582,000 ක් වූ ව්‍යාපෘති 06 ක් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2020 මාර්තු වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ඉකුත් වර්ෂවලට අදාළව එකතුව රු. 807,973 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් 2019 දෙසැම්බර් වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

### (අ) සේවක පුරප්පාඩු

(i) විධායක මට්ටමේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ලේකම් තනතුර 2001 ජූලි සිට පුරප්පාඩු වී තිබූ අතර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධිශ්‍රේණියේ නිළධාරියෙකු 2016 සැප්තැම්බර් සිට ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කර තිබුණි.

(ii) මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරක්, පුස්තකාලයාධිපති තනතුරු 02 ක්, කළමනාකරණ සහකාර තනතුරක් , ආදායම් පරීක්ෂක තනතුරක්, පෙර පාසල් ගුරු තනතුරු 02 ක් , රියදුරු තනතුරු 02 ක්, ඖෂධ සංයෝජක තනතුරක් හා වැඩ ක්ෂේත්‍ර කම්කරු යන තනතුරු වල පවතින පුරප්පාඩු 11 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාළ කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට බාධා වී තිබුණි.

### (ආ) සේවක ණය

2018 වර්ෂයේදී සේවය හැරගිය සේවකයෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 104,517 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

බලංගොඩ නගර සභා හා බලංගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ පවතින පවුල් 119 ක් සම්බන්ධයෙන් සීමා නිර්ණය සිදුකර නොතිබීමෙන් එම පවුල් නගර සභා බල ප්‍රදේශයට අයත් ද යන්න 2019 දෙසැම්බර් 31 වන විටත් හඳුනාගෙන නොතිබුණි. එබැවින් එම වරිපනම් ඒකක 119 ට අදාළව එකතුව රු. 191,289 ක් වූ වරිපනම් අයකිරීමට ද නොහැකි තත්ත්වයක් ඇති වී තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

වත්කම් ලේඛනගත නොකිරීම

එකතු වටිනාකම රු. 451,950,444 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උප ලේඛන ද වටිනාකම රු. 14,721,402 ක් වූ අතැති තොග හා මුදල් මාරු ගිණුම සඳහා විස්තරාත්මක උප ලේඛන ද යාවත්කාලීන කර නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන දුර්වලතා

කොන්ත්‍රාත් වටිනාකම රු. 478,000 ක් වූ බස්නැවතුම්පළ සිවිලිම ඉදිකිරීම පිළිබඳව අවසන් තීරණ ගෙන ඒ අනුව ඇස්තමේන්තු සකසා ලංසු ලියවිලි නිකුත් කිරීමට කටයුතු කර නොතිබීමෙන් ලංසු ලියවිලි ලංසුකරුවන්ට ඉදිරිපත් කිරීමෙන් පසුව නැවත ලංසු ලේඛන සංශෝධනය කිරීමට සිදුවී තිබුණි. ඒ හේතුවෙන් සියළුම ලංසුකරුවන් ඇගයීම් කර සාරානුකූලව ප්‍රතිචාර දැක්වූ ලංසුකරු තෝරා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු. මිලියන 37.65 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 15.91 ක් වීමෙන් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 21.74 ක් හෙවත් සියයට 58 ක් ඉතිරි වී තිබුණි.

## 4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

-----------------------------------------

ඉකුත් වර්ෂවල විගණන වාර්තා වලින් පෙන්වා දී තිබූ පහත විගණන ඡේද සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් වී නොතිබුණි.

(අ) සභාවට අයත් බලංගොඩ තානායමේ,අලෙවි කිරීම සඳහා 2016 මැයි 21 වෙනි වෙසක් පුර පසලොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව තබා ගැනීම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින නියම කළ රු. 1,515,000 ක දඩ මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ පදනමට සභාව විසින් ගෙවා තිබුණි. දඩ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව නඩු පවරා තිබූ නමුත් සහකාර සුරාබදු කොමසාරිස්ගේ චෝදනා පත්‍රයේ සඳහන් වෙසක් මාසයේ පුර පසලොස්වක පෝය දිනයේදී මත්පැන් විකිණීම යන චෝදනාද ඇතුලත්ව අනෙකුත් චෝදනා නඩුවේ චෝදනා ලෙස ඇතුලත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වල සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 9,303,601 ක් වූ මුදල් මාරු ගිණුමේ ශේෂය 2019 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) තානායම් ගාස්තු හා තානායම් ණය ගැතියන් 98 ක ගෙන් වර්ෂ 07 කට වැඩි කාලයක සිට අයකරගත යුතු රු. 953,745 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බස් නැවතුම්පළ කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුම් ප්‍රකාරව බදුකරු විසින් එකී කඩකාමර හෝ එහි යම් කොටසක බුක්තිය වෙනත් පාර්ශවයකට විකිණීම, පැවරීම හෝ අතුරු බදු දීම නොකළ යුතු වුවද, එකතුව රු. 10,100 ක මාසික කුලියකට බදු දෙන ලද කඩකාමර 02 ක් එකතුව රු. 35,000 කට අතුරු බදු දී තිබුණි. ඊට අමතරව මහජන පොලෙහි කඩකාමර බදු දීම සඳහා වූ ගිවිසුමට පටහැනිව කඩකාමර 07 ක් අතුරු බදු දී තිබුණද ඒ සම්බන්ධයෙන් 2019 දෙසැම්බර් වනවිටත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) 2016 මාර්තු 15 දින DMS/D/0217 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය මගින් බලංගොඩ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා කාර්ය මණ්ඩල තනතුරු 20 ක් අනුමත කර තිබූ නමුත් එම තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් ගිනි නිවීමේ ඒකකය 2019 දෙසැම්බර් 31 වනවිටත් විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

බී.ජී.අයි. නිරංජා,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.